www.kidworship.kr

# නැති වූ බැටළුවා

-The Lost Sheep-



56Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේගේ කතන්දරවලට බොහෝ ජනතාව අතිශය කැමැත්තෙන් සිටි නිසා යේසුස්වහන්සේ පසුපස්සේ ඔවුන් ගමන් කළා. ඒත් යේසුස්වහන්සේට අකමැති තවත් සමහරෙක් දෙනෙක් ද සිටියා.

**පළමු මිනිසා** යේසුස්වහන්සේ හරි අමුතුයි නේද!

**දෙවන මිනිසා** මම ඒකට එකඟයි, උන්වහන්සේ ගොඩක් ඉන්නේ, කෑම කන්නේ පව්කාරයන් එක්ක, එක හරි නෑ!

**පොතේ ගුරා** ඒ නිසාවෙන් යේසුස්වහන්සේ දවසක් ඒ මනුෂ්‍යයන්ට මේ කතන්දය කීවා.

.................................................................................................



57Page

**පොතේ ගුරා** බොහෝ කාලයකට පෙර වූ කතාවක් මේ. ඒ කාලයේ බැටළුවන් සියයක් සිටිය එඬේරෙක් සිටියා. මේ එඬේරා ස්වකීය බැටළුවන්ට බොහෝ සෙයින් ආදරේ කළා, හොඳින් බලාගත්තා. බැටළුවන් තණපිට්ටනිවල සිට ගෙදරට එන්න යන වේලාවේදී මේ එඬේරා බැටළුවන් ව ගණන් කරනවා.

**එඬේරා** හරි දැන් බලමු - එකයි, දෙකයි, තුනයි... විස්සයි, තිහයි, හතළිහයි... අනූහතයි, අනූඅටයි, අනූනවයයි ඔහ් ? පොඩ්ඩක් ඉන්න... ආයෙත් ගණන් කරමු.., එකයි, දෙකයි, තුනයි... අනූහතයි, අනූඅටයි, අනූනවයයි ... එක බැටළුවෙක් නැතිවෙලා!!

**පොතේ ගුරා** කොපමණවරක් ගණන් කළත් බැටළුවන්ගේ ගණණ අනූනවයයි.

**එඬේරා** හ්ම් ? කෝ සියවන බැටළුවා ?

**පොතේ ගුරා** එඬේරා තමුන්ගේ නැතිවුණ බැටළුවා සම්බන්ධව ගොඩක් කරදර වුණා. එඬේරා කොපමණ නම් දුක් වුණාද කිවහොත් හැමතැනකම ගොස් බැටළුවා සෙව්වා.

.................................................................................................



58Page

**පොතේ ගුරා** ගොඩාක් රෑ බෝවීගෙන ආවා. සෙවීමේ උත්සහය අත්නොහැරම එඬේරා හරිම කලබලයෙන් හැමතැනකම බැටළුවා සෙව්වා. එසේ සොයමින් සිටියදී එකපාරටම එඬේරාට ශබ්දයක් ඇසුණා.

**නැති වූ බැටළුවා** බැහ්හැහැ... බිහ්හැහැහැ....

**පොතේ ගුරා** එඬේරා ඒ ශබ්දය ඇසුණු දිශාවට දුවගෙන ගියා. ඒ නැතිවුණු බැටළුවා කඳු මුදුනත අද්දර එල්ලීගෙන සිටියා. හරිම පව්, ඒ බැටළුවා, තෙමිලා, බයේ වෙව්ලමින් සිටියේ.

**එඬේරා** මේ ඉන්නේ ඔයා! අනේ, ඔයා කොයිතරම් නම් හයවෙන්න ඇතිද? දැන් ඔයා හයවෙන්න එපා. මම ඔයාව බේරගන්න ආවා. ආහ්... එන්න ඔයාව උස්සන්න...

**පොතේ ගුරා** ඒ එඬේරා එයාගේ බැටළුවා බේරාගෙන, හරිම ප්‍රීතියෙන් ඌ තමගේ කරපිට තබාගෙන නැවත නිවසට ගියා.

.................................................................................................

**පොතේ ගුරා** යේසුස්වහන්සේ ජනතාවට කතාකරමින් :



59Page



60Page

| | |
|---|---|
| යේසුස්වහන්සේ | ඔයාලගේත් බැටළුවෙක් නැතිවෙලා, පසුව සම්භවුණොත් ප්‍රීතිවන්නේ නැද්ද? එසේම පසුතැවිල්ල ඕනෑ නැති ධර්මිෂ්ඨයන් 99කට වඩා, පසුතැවිලි වන්නාවූ එක පව්කාරයෙකු ගැන ස්වර්ගයේ ඉමහත් ප්‍රීතියක් ඇත්තේය. දෙවියන්වහන්සේ කිසිකෙනෙක් නැතිකරගන්න කැමති නෑ. |
| පොතේ ගුරා | යේසුස්වහන්සේ එඬේරා සහ බැටළුවා සම්බන්ධ තවත් කතාවක් කිව්වා. |
| යේසුස්වහන්සේ | යහපත් එඬේරා එයාගේ බැටළුවන් හොඳින් අඳුනනවා. එපමණක්ද? බැටළුවන්ද එයාලගේ එඬේරාගේ කටහඬ හොඳින් අඳුනනවා. ඔවුන් එඬේරා පසුපසින්ම යනවා. නමුත් කුළීකාරයෙකු බැටළුවන්ගේ අනතුරු ඉදිරියෙන් පලා යනමුත්, සැබෑ එඬේරා බැටළුවන් අත්හැර පලා නොගොස් ඔවුන්ව විනාශ කරන්නට එන වන මෘගයන් සමග සටන් කරනවා. යහපත් එඬේරා නිරන්තරයෙන්ම තමුන්ගේ බැටළුවන් ආරක්ෂා කරනවා. |
| පොතේ ගුරා | බැටළුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීම පිණිස, යේසුස්වහන්සේද තමුන්ගේ ජීවිතය වුවත් පාවාදෙන බව ජනතාවට කියා සිටියා... |
| ජීවිතයට අදාල කිරීම | දෙවියන්වහන්සේ සෑම කෙනෙක්ටම ආදරෙයි. සෑම කෙනෙක්ම සොයනවා. ඔයාගේ යාලුවන් දිහා හොඳින් බලන්න. කවුරුහරි කෙනෙක් ඇති, තනිවෙලා, කොන්වෙලා, ආදරයක් නැතිව, අසරණවෙලා, එයා හරියට ජීවිතේ අතරමං වුණා බැටළුවෙක් වගේ නේද? එයාව යේසුස්වහන්සේ ළඟට ගෙනයන්න අදම උත්සහයක් ගන්න. |